# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල)නිළධාරී සංගමය

**ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**


ලි:ප:අංකය 7570 - නිළ වෙබ් ලිපිනය – www.oisbku.com

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா


2022.02.02

**අප නිළධාරීන්ගේ නොවිසඳුන ගැටළු විසඳා ගැනීම සඳහා ඉදිරි කටයුතු සඳහා පෙළ ගැසෙමු.**

සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය / සහෝදරිය,

අප නිළධාරීන්ට සෘජු ලෙසම බලපාන ප්‍රධාන ගැටළු කිසිවක් දෙපාර්තමේන්තුව ස්ථාපිත කොට වසර 07 ට වැඩි කාලසීමාවක් ගතවී තිබුනද මේ දක්වා විසඳුම් ලබාදීමට අප අමාත්‍යාංශය හෝ සමෘද්ධි සංවර්ධන දෙපාර්ථමේන්තුව හෝ ක්‍රියාකර නොමැත.වෘත්තීය සමිති සාකච්ඡා වලදී මේ පිළිබඳව සාකච්ඡා කෙරුණද ඒ සෑම අවස්ථාවකදීම බලධාරීන්ගේ පිළිතුර වනුයේ අපගේ ගැටළු ඔවුන්ද අවශ්‍ය තැන්වලට යොමුකර ඇති බවත් එම ආයතන වලින් පිළිතුරු ලද විගස ඊට අදාල ඉදිරි කටයුතු සිදුකරණ බවත්ය.නමුත් මේ රටේ අනෙකුත් රාජ්‍ය සේවකයන්ගේ මෙන්ම යම් තරමකට හෝ අප කළමණාකරුවන්ගේ ගැටළු වලට විසඳුම් ලබාදීමට අප විශාල ලෙස කැපකිරීම් කර පාර්ලිමේන්තුවට පත්කර යවන මැති ඇමති වරුන් හා රජයෙන් වැටුප් ලබාගෙන රාජකාරී කරණ ඉහතින් සඳහන් කළ ආයතන වල නිළධාරීන් කටයුතු කර ඇත. එහෙත් අපගේ ගැටළු විසඳීමට අවුරුදු 07 කට වැටි කාලයක් ගත වුවද ඔවුන්ට තව දුරටත් කාලය අවශ්‍ය බව පවසයි.මේ සම්බන්ධයෙන් ඔබ වෘත්තීය සමිති වලට දොස් පවරමින් කාලය ගත කරයි.එය කොතෙක් දුරට සාධාරණ දැයි ඔබම සිතා බලන්න.ඔබ වෘත්තීය සමිති සාමාජිකත්වය ලබා තිබේද?අප නිළධාරීන් බහුතරයක් කුමන හෝ හේතුවක් පදනම් කරගෙන වෘත්තීය සමිති සාමාජිකත්වය ලබා නොමැත.එසේත් නොමැතිනම් ඔබ නියෝජනය කරන වෘත්තීය සමිතිය ඔබගේ අයිතිවාසිකම් වෙනුවෙන් කොතෙක් දුරට පෙනී සිටින්නේද?අප සියළු දෙනා එක මිටකට එකතු නොවුනහොත් අප පරදිනු නියතය.පාලකයන් අතීතයේ මෙන්ම වර්තමානයේද,අනාගතයේද ජයග්‍රහණය කරණු ඇත.ඔවුන් පරාජය කිරීමටනම් නිසැකවම අප සියළු දෙනා එකා වන්ව වෘත්තීය ජයග්‍රහණ උදෙසා සටන් වැදිය යුතුමය.ඒ සඳහා පහත සඳහන් කර ඇති ඉල්ලීම් පිළිබඳව ඔබගේ අවධානය මැනවින් යොමුකර ඒවා දිනාගැනීම සඳහා ඔබ වෘත්තීය සමිතියක් නියෝජනය නොකරන්නේ නම් අප සංගමය සමඟ අත්වැල් බැඳගන්නා ලෙසට මෙයින් ඇරයුම් කරමු.

මෙතෙක් කල් නොවිසඳුන සේවා සංයුතිය (කාඩර්) අනුමත කිරීම දිගින් දිගටම ප්‍රමාද කර සමෘද්ධි සංවර්ධන නිළධාරීයෙක් ලෙස පත්වීම් ලද ඔබ විශ්‍රාම යන තෙක්ම සමෘද්ධි සංවර්ධන නිළධාරියක් ලෙසම විශ්‍රාම යෑමට සැලැස්වීම.

මේවන තෙක් අමාත්‍ය මණ්ඩලයට යොමු කර ඇති 2014 වර්ෂයේ සිට සමෘද්ධි දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කළ සේවකයින්ගේ වැටුප නිශ්චිත නොකිරීම.1995 වර්ෂයේ සිට සමෘද්ධි දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කළ සේවකයින්ට පොලී සහන ලබාදීමට අදාලව සකස් කරණලද කැබිනට් පත්‍රිකාව / MN -07 කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතර පවතින දැඩි වැටුප් විෂමතාවය දුරු කිරීමට යොමුකර ඇති අප සංගමයද මැදිහත්වී සකස් කරණලද කැබිනට් පත්‍රිකාව ආදි කැබිනට් පත්‍රිකා මේ දක්වා අමාත්‍ය මණ්ඩල න්‍යාය පුස්තකයට ඇතුලත් නොකර සිටීම.මේ වෙනුවෙන් අප රාජ්‍ය අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු සඳහා අවශ්‍ය පරිදි මැදිහත් නොවීම. .

බැංකු බැංකු සමිති සහ කාර්යාල නිළධාරීන්ට නිළයට සරිලන පත්වීම් ලිපියක් මේ මොහොත දක්වා ලබා නොදීමට කටයුතු කිරීම.

වසර 26 ක සේවා පලපුරුද්දක් ඇති ඔබ එම සේවා පලපුරුද්ද පදනම් කරගෙන MN-03 සේවා ගණයට උසස් කිරීමට කටයුතු නොකිරීම සහ පුරප්පාඩු වන කළමණාකරු තනතුරු සඳහා අභ්‍යන්තර බඳවා ගැනීම මේ මොහොත තෙක් සිදු නොකිරීම.(70% සහ 30%)

මේ වන විට ලංකාව පුරා පිහිටි සමෘද්ධි බැංකු 1073 ක් සහ බැංකු සමිති 374 න් 95% පමණ ප්‍රමාණයක් පරිඝණක ජාලගත කර අවසන් අතර ඒ වෙනුවෙන් දැවැන්ත භාරදූර කාර්ය භාරයක් ඉටුකරණ ලද බැංකු කාර්ය මණ්ඩලය සහ A+ (පරිඝණක තාක්ෂණ) නිළධාරීන් කණ්ඩායමට පයින් ගසා අලුතෙන් බඳවාගන්නා ලද උපාධිධාරී සංවර්ධන නිළධාරීන් බැංකු කාර්ය මණ්ඩලයට සහ පරිඝණක තාක්ෂණ නිළධාරීන් ලෙස බඳවා ගැනීමට පිඹුරුපත් සැකසීම මෙ වන විටත් A+ කණ්ඩායම වෙනුවට උපාධිධාරී සංවර්ධන නිළධාරීන් සඳහා පත්වීම් ලිපි සකස් කර අවසන් කර ලබා දීමට කටයුතු කිරීම.

තවද බැංකු කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු,කළාප සහකාරට අයත් රාජකාරී කටයුතු,බැංකු සමිතියේ සහකාර කළමණාකරුට අයත් රාජකාරී කටයුතු හා ක්ෂේත්‍ර නිළධාරීන්ට අයත් රාජකාරී කටයුතුවලට අයත් කුඩා කණ්ඩායම් ගොඩනැගීම,අරමුදල් ඒකරාශී කිරීම,බැංකු ගිණුම් ප්‍රවර්ධණය,ණය දීම,ණය අධීක්ෂණය,ව්‍යාපෘති සැකසීම,සහ අධීක්ෂණ කටයුතුයනාදී රාජකාරී මහ මෙරක් සේ තරමට ගෙන 1995 සිට මේ දක්වා ඉටුකළ සමෘද්ධි සංවර්ධන නිළධාරී ක්ෂේත්‍ර නිළධාරියා කුණු බක්කියට දමා එම රාජකාරී කටයුතු මුලින් ආපු කණට වඩා පසුව ආපු අඟ ලොකු සේ සලකා සියලු දෙනාගේ අධීක්ෂණ කටයුතු වක්‍රාකාරව උපාධිධාරී සංවර්ධන නිළධාරීන්ට පැවරීමට කටයුතු කිරීමට පිඹුරුපත් සැකසීම.මේ තුලින් අවුරුදු 26 ක සේවාකාලයක් සහිත සමෘද්ධි සංවර්ධන නිළධාරි තනතුර හැල්ලුවට ලක්කිරීම.

අප සංගමය මඟින් ක්ෂේත්‍ර නිළධාරීන්ට මාසිකව රුපියල් 1500.00 ක දීමනාවක් බැංකුවට ඔවුන් දක්වන දායකත්වය මත ලබාදෙන ලෙස කළ ඉල්ලීමට එකඟතාවය පලකලද මේ දක්වා ඒ සඳහා මූලික පියවරකුදු නොගැනීම.

සෑම වසරවසරකම සමෘද්ධි බැංකුවල වර්ෂ අවසාන ගිණුම් පියවීමේදී සියළුම කොටස් කරුවන්ට ලාභාංශ ගෙවීමටත් විගණන හා විමර්ශණ ගාස්තු ගෙවීමටත් අවසර ලබා දෙන අතර සියළුම බැංකු ලාභ උපයන ආකාරයට මෙහෙයුම් කටයුතු කරණ බැංකු හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා එම ලාභය විසර්ජනය කිරීමට මේ දක්වා කටයුතු නොකිරීම.සහ මේ මොහොත වන විට එම කටයුත්ත කිරීමට අනුමැතිය දුන්නේනම් අප නිළධාරීන් විශ්‍රාම යාමට පෙර රජයට ගෙවියයුතු වැන්දඹු අනත්දරු අරමුදලට හෝ 60% ක දායකත්වය ගෙවීමට යම් අස්වැසිල්ලක් වනු ඇත.එය මේ දක්වා ඉටු නොකිරීම.

සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය / සහෝදරිය,
උපාධිධාරී සංවර්ධන නිළධාරීන්ට අප විසින් අවුරුදු 26 ක් පුරාවට සිදුකරණ ලද රාජකාරී කටයුතු පැවරීමට යාමේදී කළමණාකරුවන්ගේ සංගමය ඒ පිළිබඳව මුනිවත රැකීම හා එයට අවශ්‍ය අනුබල දීම අප සංගමය ඉතා පිළිකුලෙන් යුක්තව හෙලා දකිමු.

ඉහත තොරතුරු සියල්ලට මෙන්ම අපගේ රැකියාවේ දැනට උද්ගතව ඇති ප්‍රශ්ණ බොහෝමයකට සේවා

2022.02.02

සංයුතියක් නොමැති කම හා විධිමත් උසස් වීම් පරිපාටියක් නොමැතිකම බලපා ඇති බව සත්‍යකි අප දැඩි මානසික පීඩනයකට ලක්කර ඇති වැටුප් විෂමතාවයද (කළමණාකරු සමෘද්ධි සංවර්ධන නිළධාරි වැටුපේ දැඩි වෙනස) ඉහත කරුණ නිසාම උද්ගත වූවකි. මෙම තත්වයට ඔබ පුද්ගලිකව වගකිව යුතුය.ඔබ කරනා වරදට සමස්ත අපගේ ජීවිත වලින් වන්දි ගෙව්වා හොදටම ඇතිය.
ඒ නිසාම ඔබ පුද්ගලිකව තීරණයක් ගතයුතු කාලය එළඹ ඇත.සේවා සංයුතිය තුල බැංකුවේ ඔබ දරණ තනතුර ස්ථාපිත කොට එයට අදාල වැඩ පැවරුමක් සහිත පත්වීම් ලිපියක් ලබා දීම සම්බන්ධයෙන් ඔබ දැනට සාමාජිකත්වය දරණ වෘත්තීය සමිතිය දැඩි ලෙස විරුද්ධ බව වගකීමෙන් ප්‍රකාශ කළ හැකි අතර එම ප්‍රශ්ණය මෙලෙස වසර ගනනාවක් ඇදි ඇදී තිබීමට එකම හේතුව එය බව අවධාරණය කරමු.

පවතින ප්‍රශ්ණ වලට සහ වෘත්තීය සමිති වලට බැන වදිමින් කාලය කා නොදමන්න.ඔබගේ තනතුරට /උසස්වීමට,වැටුපට වලකපන අප ජීවිතයේ යහපත්ම කාලය කාබාසිනියා කළ වෘත්තීය සමිතියෙන් ඉවත් වන්න.අපගේ (www.oisbku.com) යන වෙබ් අඩවියට පිවිස එම තොරතුරු වලට අනුව ඔබ සැම අප සමග එක්වන්න.එසේ ඔබ සිතට අවංකව කසේරුකාව කෙලින් තබාගෙන තීරණයක් ගතහොත් ඉතා කෙටි කළකින් ඉහත දැවෙන ප්‍රශ්ණ විසදාගත හැකි බව අප සපත කරමු.

එන්න අප සමග එක්වන්න,එක්නොවී බැන නොවදින්න,ඔබ වෙනුවටද උපාධිධාරියකු පැමිණ ඔබගේ තනතුර සහ පුටුව ඩැහැගන්නා තුරු උඩ බලාගෙන නොසිටින්න.

ප්‍රධාන සභාපති
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

ප්‍රධාන ලේකම්
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය


| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
|---|---|---|
| එන්.ජී.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ජී.වී.බස්නායක |
| දු:අං: 071-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |